| 3.2 | දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා භාවිතා කරන ඉඩම් 27 ක් පැවැති නමුත් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රය, බොරැල්ල ශික්ෂණ රෝහල ඇතුළුව රෝහල්, ඔසු උයන්, ප්‍රජා සෞඛ්‍ය ප්‍රාදේශීය කාර්යාල හා සංචාරක බංගලා පිහිටි ඉඩම් 19 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටද දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන නොතිබුණි.<br><br>දැනට භුක්ති විඳින පදනම්න් අදාළ හිමිකම ඇති ආයතන වෙතින් ඉඩම් පවරා ගැනීමට එම ආයතන සමඟ කළමණාකරන කටයුතු සිදු කරන බව දක්වා ඇති නමුත් මේ දක්වා එම ඉඩම් පවරා ගැනීමට නොහැකිව තිබුණි. | කාලයක සිට ඉඩම් අයිතිය පවරා ගැනීමකින් තොරව රාජ්‍ය ආයතන විසින් බුක්ති විඳිනු ලබන සියලුම ඉඩම් සම්බන්ධව 2018 -2019 වර්ෂවලදී එම ඉඩම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට ලබා දුන් උපදෙස් පරිදි ආයුර්වේද දෙපාර්තමේන්තුවේ රෝහල් හා ආයතන පිහිටා ඇති ඉඩම් අයිතිය පවරා නොගෙන තක්සේරු කළ ඉඩම් 07ක රු.612,925,000 ක වටිනාකම ගිණුම් ගතකර ඇත.එමෙන්ම අයිතිය පවරාගත් ඉඩම් 6ක් රු. 1,738,695,000 වටිනාකම තක්සේරු කර ගිණුම් ගත කර ඇත.<br><br>එසේම මේ වන විට පවරා ගෙන නොමැති ඉඩම් 13 සම්බන්ධයෙන් ඉදිරි පියවර ගනිමින් පවතී. එම ඉඩම් අතරින් කතරගම ඉඩම (විහාර හා දේවාල ගම් පනත අනුව) හා පට්ටිපොල ඉඩම (වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් බැවින්) බුක්තියට පමණක් ලබා දී ඇත.<br><br>ආයුර්වේද දෙපාර්තමේන්තුව වෙත අයිතිය පවරා ගත් ඉඩම් =12<br>අයිතිය පවරා ගෙන ඇති සහ ගිණුම් ගත කළ ඉඩම් =06<br>අයිතිය පවරා ගෙන ඇති එහෙත් තක්සේරු කර ගිණුම් ගත නොකළ ඉඩම් =06<br>අයිතිය පවරා ගත යුතු ඉඩම් =13<br>නැවත භාර දිය යුතු ඉඩම් =06<br>අයිතිය පවරා නොගෙන ගිණුම් ගත කර ඇති ඉඩම් =07<br>අදාළ ආයතන විසින් බුක්තියට පමණක් ලබා දී ඇති ඉඩම් =02<br>**(ඇමුණුම 6-II )**<br><br>එසේම දෙපාර්තමේන්තුවේ ඉල්ලීමකට අනුව අංක SA/GFS/01/01/11/220 හා 2026.04.10 දිනැති රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ ලිපියට අනුව දෙපාර්තමේන්තුවට පවරාගෙන ඇති හම්බන්තොට පර්යේෂණ රෝහල හා ත්‍රිකුණාමලය කෝනේෂපුරි සිද්ධ ශික්ෂණ රෝහලේ ඉඩම් තක්සේරු කර දීම සඳහා තොරතුරු යැවීමට කටයුතු කරමින් ඇත.**(ඇමුණුම 6-III)** |
| 3.3 | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5.5 ඡේදය ප්‍රකාරව රාජ්‍ය ආයතන විසින් නව ගාස්තුවක් හඳුන්වා දීමට පෙර පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගත යුතු වුවද ආයුර්වේද පනත හෝ වෙනත් එවැනි ලිඛිත නීතියක් මඟින් ප්‍රතිපාදන සලසා නොගෙන 2022 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ සේවාලාභීන්ගෙන් එකතු කළ විවිධ ගාස්තු ප්‍රමාණය රු.21,564,057 ක් විය. ආදයම් ගණන්දීමේ නිලධාරියකු වශයෙන් ආයුර්වේද | ගාස්තු සංශෝධනය සඳහා වන අමාත්‍ය මණ්ඩල පත්‍රිකා කෙටුම්පත සකස් කර මේ වන විට අනුමැතියට යොමු කර ඇත. **(ඇමුණුම 6-IV )** |

| | | |
|---|---|---|
| | කොමසාරිස් ජනරාල්වරයාට කටයුතු කිරීමට හැකිවන පරිදි නීති සම්පාදනය කරගෙන නොතිබුණු බැවින් එම ගාස්තු භාණ්ඩාගාර පවතෙයුම් අධ්‍යක්ෂ ජනරාල්වරයා අදායම් ගණන්දීමේ නිලධාරියා වශයෙන් කටයුතු කරන බවකුණුම් සහ ගාස්තු 20.03.99.00 යන ආදායම් සංකේතය යටතේ රාජ්‍ය ආදායමට බැර කර නිබුණි.<br><br>ආදායම් ගණන්දීමේ නිලධාරියා වශයෙන් ආයුර්වේද කොමසාරිස් ජනරාල්වරයාට කටයුතු කිරීමට හැකිවන පරිදි නීතිමය පසුබිම සකස් කර ගැනීම සඳහා 2023 වර්ෂයේ කමිටුවක් පත්කර ඇති බවත් එම කමිටුවේ තීරණ අනුව ගාස්තු සංශෝධනය හා නව ගාස්තු හඳුන්වාදීම සිදු කිරීමට බලාපොරොත්තු වන බවත් ප්‍රකාශ කර ඇති නමුත් ප්‍රගතිය වාර්තා කර නොතිබුණි. | |
| 11 | ඇස්තමේන්තු පිරිවැය රු.මිලියන 350ක් වූ පාරම්පරික වෛද්‍ය දැනුම සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතියේ II වන අදියර 2020 වර්ෂයේ සිට ඉදිරි වර්ෂ 04 ක් තුළ ක්‍රියාත්මක කිරීම සඳහා 2019 අප්‍රේල් 03 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණි. එසේවුවද, 2020 වර්ෂයේදී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ රු.1,500,000 ක ප්‍රතිපාදන සලසා ගෙන කාර්යයන් 04 ක් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණද පාරම්පරික වෛද්‍යවරුන් ඇගැයීම යන එක් කාර්යයක් පමණක් ඉටුකර ඒ සඳහා රු.697,408 ක් වැයකර තිබුණි.<br><br>ප්‍රතිපාදන නොලැබුණු බව ප්‍රකාශ කර ඇත. ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගෙන නොතිබුණි. | පාරම්පරික වෛද්‍ය දැනුම සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතියේ II වන අදියරෙහි ඉටුනොකළ කාර්යන් සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නිර්දේශ වලට යටත්ව හා කැබිනට් තීරණ අංක අමප/23/2351/610/093 අනුව ප්‍රතිපාදන සලසාගෙන ඇති අතර ඒ අනුව 2024 වර්ෂයේදී ලද රු.1,000,000 ක වියදම් දරා ඇත. 2025 වසර සඳහා මෙම ව්‍යාපෘතිය සඳහා රු.මි. 25ක් වෙන් වී ඇති අතර ඉන් රු.8,847,828.93 වැය කර ඇත. ඒ අතර පාරම්පරික දේශීය වෛද්‍ය වෘත්තිකයන්ගේ තොරතුරු ඇතුළත් පරිගණක මෘදුකාංගය නිර්මාණය සඳහා රු.1,250,000 වැය කර ඇත. පුස්කොළපත් ඉරු 60708ක් පරිලෝකනය සඳහා රු.4,355,434.75 වැය කර ඇත. 2025 වර්ෂයෙන් එම ව්‍යාපෘතිය අවසන්ව ඇත. **(ඇමුණුම 6-V )** |
| 11 | ආයුර්වේද දෙපාර්තමේන්තුව හා එහි අනුබද්ධ ආයතන, රෝහල්, වෛද්‍ය මධ්‍යස්ථාන ඇතුළු සම්පූර්ණ ආයතන පද්ධතියම ඇතුළත්වන පරිදි කළමනාකරණ තොරතුරු පද්ධතියක් (MIS) සැකසීම සඳහා ඉකුත් වර්ෂයේ මෙන්ම සමාලෝචිත වර්ෂයේදීද රු. මිලියන 25 බැගින් ප්‍රතිපාදන සලසාගෙන තිබුණු නමුත් එම කාර්යය ඉටුකර නොතිබුණි.<br><br>අදාළ කළමණාකරන දත්ත පද්ධතිය මේ දක්වාම ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි. | ආයුර්වේද දෙපාර්තමේන්තුව හා ඊට අනුබද්ධ ආයතන සහ රෝහල් වෛද්‍ය මධ්‍යස්ථාන ඇතුළු ආයතනයන් සඳහා තොරතුරු කළමනාකරණ පද්ධතියක් (MIS) පිළිබඳ ව්‍යාපෘතිය සකස් කර ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව (NPD) වෙත ඉදිරිපත් කළ අතර එහි සංශෝධන සිදු කිරීමට අවශ්‍ය බව නැවත දෙපාර්තමේන්තුව වෙත දන්වා තිබුණි. ඒ අනුව ඉදිරිපත් කරන ලද නිර්දේශ අනුව නැවත ව්‍යාපෘතිය සකස් කර සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ තොරතුරු කළමනාකරණ පද්ධතියට සමගාමීව එහි බිල්ලූ ප්‍රින්ට් එක අනුව ආයුර්වේද දෙපාර්තමේන්තුවේ තොරතුරු කළමනාකරණ පද්ධතියද සකස්කර ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව (NPD) වෙත ඉදිරිපත් කල අතර, සමාලෝචනයේදී එම පද්ධතිය සංක්ෂිප්ත කර දෙපාර්තමේන්තුව සඳහා වෙන් වූ පද්ධතියක් ලෙස සකස් කරන ලෙසට උපදෙස් ලබා දී ඇත. ඒ අනුව ඉදිරි කටයුතු කරමින් පවතී. |

| | | |
|---|---|---|
| 3.6 | 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 10 වන වගන්තිය ප්‍රකාරව ආයුර්වේද ආරෝග්‍ය ශාලා, ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාර, ආයුර්වේද ඖෂධ ශාලා හෝ ආයුර්වේද බෙහෙත් ගබඩා ආයුර්වේද කොමසාරිස්වරයා විසින් ලියාපදිංචි කරනු ලැබිය යුතු වුවද, පංචකර්ම සහ සම්බාහන මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම පිළිබඳ විධිවිධාන පනතට ඇතුළත් කර නොතිබුණු බැවින් පංචකර්ම වෛද්‍ය ක්‍රමය භාවිතය නියාමනය කළ නොහැකිවී තිබුණි.<br><br>පංචකර්ම සහ සම්භාහන මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම පිළිබඳ විධිවිධාන ඇතුලත් වන පරිදි ආයුර්වේද සංග්‍රහය සකස් කර නීති කෙටුම්පත් සම්පාදකට ඉදිරිපත් කර ඇති බව ආයුර්වේද කොමසාරිස් ජනරාල් ප්‍රකාශ කර තිබුණි. මෙම නිරීක්ෂණයද 2020 වර්ෂයේ සිට ඉදිරිපත් කර ඇති නමුත් මේ දක්වා ප්‍රගතියක් අත්කරගෙන නොතිබුණි. | 1961 අංක 31 දරණ ආයුර්වේද පනත අනුව ආයුර්වේද ප්‍රතිකාර මධ්‍යස්ථාන (බෙහෙත් ශාලා) නියාමනය කිරීමේ නෛතික බලතල ආයුර්වේද කොමසාරිස්වරයා වෙත පැවරී තිබේ.<br>ඒ අනුව සම්බාහන මධ්‍යස්ථාන හා ස්පා නමින් හැඳින්වෙන ආයතන ආයුර්වේද දෙපාර්තමේන්තුව මඟින් නියාමනය නොකරන අතර පංචකර්මය යනු ආයුර්වේද වෛද්‍ය ප්‍රතිකාර ක්‍රමයේ එන වමන කර්ම,විරේක,වස්ති, නස්ත හා රක්ත මෝක්ෂණ වැනි ප්‍රතිකාර ක්‍රමයක් වන අතර මෙහිදී එම ප්‍රතිකාර සිදුකිරීමේදී රෝහල් ගත කර වෛද්‍යවරයෙකුගේ අධීක්ෂණය යටතේ පංචකර්මයේ එක් අංගයක් ලෙස පූර්ව කර්ම හා පශ්චාත් කර්ම ලෙස තෙල අභ්‍යංගය සිදුකරනු ලැබේ.එනිසා පංචකර්ම ආයතන යනුවෙන් විශේෂිත ආයතන වර්ගයක් නියාමනය කිරීමක් සිදු නොකරයි.<br>අංක 2379/02 දරණ 2024.04.08 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව ආයුර්වේද සංග්‍රහය ප්‍රකාශයට පත් කර ඇත.<br>එසේම ආයුර්වේද සංග්‍රහයේ II කොටස සඳහා නීති කෙටුම්පතෙන් පංචකර්ම ප්‍රතිකාර ක්‍රමය පවත්වාගෙන යන ආයතන පිළිබඳ නිර්නායක සකස් කිරීම සඳහා කමිටුවක් පත්කර කටයුතු කරමින් පවතී. **(ඇමුණුම 6-VI)** |
| 3.7 | අවශ්‍යතාවය නිවැරදිව හඳුනා නොගෙන හා ශක්‍යතා අධ්‍යයනයකින් තොරව 2015 මාර්තු 16 දින රු.මිලියන 28ක් වැයකර බණ්ඩාරනායක ආයුර්වේද පර්යේෂණායතනයට යන්ත්‍ර හා උපකරණ 14 ක් මිලදී ගෙන තිබුණු අතර ඉන් රු.මිලියන 21 ක් වටිනා යන්ත්‍ර 08 ක් 2023 ජූලි 11 වන විටත් සවිකර නොතිබුණි. මුළු පිරිවැය රු.14,591,311ක් වූ යන්ත්‍ර 06 ක් නිෂ්පාදනාගාරය සඳහා අවශ්‍ය නොවන බවට 2020 ඔක්තෝබර් 05 දින පත්කර තිබුණු කමිටුවක් විසින් හඳුනාගෙන තිබුණි. නිසි කොන්ත්‍රාත් ගිවිසුමකට සහ සේවා හා අළුත්වැඩියා සඳහා ගිවිසුම්වලට එළඹීමකින් තොරව මෙම කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කර තිබුණු බැවින් සවිකර තිබුණු යන්ත්‍ර උපකරණද සමාලෝචිත වර්ෂය වන විට භාවිතයට ගත නොහැකි තත්වයේ පැවතුණි. මේ අනුව මෙම ව්‍යාපෘතිය සඳහා වැය කර තිබුණු රු. 28,342,712 ක මුළු මුදල නිශ්කාර්ය වියදමක් විය.<br><br>අවශ්‍යතාවය නිවැරදිව හඳුනා නොගෙන හා ශක්‍යතා අධ්‍යයනයකින් තොරව මිලදීගත් මෙම උපකරණ වලින් රු.මිලියන 20.98ක් වටිනා යන්ත්‍ර 09ක් 2024 ජුනි 18 දින ආයුර්වේද ඖෂධ සංස්ථාවට භාරදී තිබුණි. යන්ත්‍ර 05ක් රඳවා ගෙන තිබුණු නමුත් ඉන් රු.2,667,050ක් වටිනා යන්ත්‍ර 03ක් තවදුරටත් ප්‍රයෝජනයට නොගෙන ඌණ උපයෝජිතව තිබුණි. 2018 වර්ෂයේ සිට 2022 දක්වා විගණන වාර්තාවල පෙන්වා දී ඇති | මේ සම්බන්ධව සෞඛ්‍ය අමාත්‍යාංශයේ හදිසි වැටලීම් අංශය විසින් මුලික විමර්ශනයක් සිදුකරන ලද අතර, එම වාර්තාවේ, සෞඛ්‍ය ලේකම් විසින් අනුමත කල පරිදි 2015 වසරේදී ආයුර්වේද පර්යේෂණායතනයේ ව්‍යාපෘතින් සඳහා මිලදීගත් උපකරණ ඌන උපයෝගිවීම සම්බන්ධයෙන් විමසා බැලීම සඳහා පත්කරන ලද තාක්ෂණික කමිටුවේ වාර්තාවේ නිර්දේශ අනුව එම උපකරණ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කර ඇත. **(ඇමුණුම 6-VII)**<br>ඒ අනුව මෙම යන්ත්‍ර 14 න් 9ක් ආයුර්වේද ඖෂධ සංස්ථාවට භාරදී තිබුණි. ඉතිරි යන්ත්‍ර 5න් 1ක් ගම්පහ වික්‍රමාරච්චි රෝහලට ඉල්ලුම් කර ඇත. යන්ත්‍ර 4ක් රෝහලේ ප්‍රයෝජනයට යොදවා ඇති අතර ඉන් යන්ත්‍ර 3ක් අලුත්වැඩියා කිරීමට කටයුතු යොදා ඇත. ඉන් එක් යන්ත්‍රයක් භාවිතයට ගත නොහැකි තත්ත්වයේ පවතී. |

| | | |
|---|---|---|
| | පරීදි ආයතනයේ අවශ්‍යතාව නිසිපරිදි හඳුනා නොගෙන පිළිගත් අනුමත සැලසුමකින් තොරව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා මුදල් රෙගුලාසි වලට පටහැනිව අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව හා ඵලදායිතාව පිළිබඳ නොසලකා සිදු කර ඇති මෙම යන්ත්‍ර සුත්‍ර මිලදී ගැනීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව මේ දක්වා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | |
| 1.11 | බණ්ඩාරනායක අනුස්මරණ පර්යේෂණ ආයතනය සඳහා එක් එක් විෂය ක්ෂේත්‍රයට අදාළව පර්යේෂණ නිලධාරී තනතුරු 18 ක් හා පර්යේෂණ සහායක තනතුරු 12 ක් අනුමත කරගෙන තිබුණද, ඉන් කිසිවෙකු බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර චමල් රාජපක්ෂ ආයුර්වේද පර්යේෂණ රෝහලට පර්යේෂණ කාර්යය මණ්ඩලයක් අනුමත කරගෙන නොතිබුණි. මේ අනුව ආයුර්වේද පර්යේෂණ රෝහල් පිහිටුවීමෙන් අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි.<br><br>2021, 2022 හා 2023 වර්ෂවලදී මේ සම්බන්ධයෙන් විගණන නිරීක්ෂණ ඉදිරිපත් කර ඇති නමුත් මේ දක්වා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | භෞතික සම්පත් සපයා ගැනීමට සමගාමීව බඳවා ගතයුතු මානව සම්පත් දෙපාර්තමේන්තුව යටතේ ඇති එක් එක් ආයතන සඳහා කලින් කලට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමත කර දෙන ලද නමුත් රජය කලින්කලට ගන්නා වූ ප්‍රතිපත්ති තීරණ මත භෞතික සම්පත් සපයා දීමට සමගාමීව මානව සම්පත් සපයා ගැනීමට නොහැකිව ඇත.<br>මේ වන විට බඳවා ගැනීම සඳහා අනුමැතිය ලැබී ඇත්තේ **PL-1** කාණ්ඩයේ තනතුරු සඳහා පමණි. මේ සම්බන්ධව අවස්ථා කිහිපයකදී උත්සාහ දරණ ලදී. කෙසේ වුවද නැවතත් රාජ්‍ය සේවයේ තනතුරු පුරප්පාඩු සහ බඳවා ගැනීම් සඳහා අග්‍රාමාත්‍ය කමිටුව වෙත අදාළ ඉල්ලීම් ඉදිරිපත් කිරීමට කටයුතු කළද එම කමිටුව විසුරුවා ඇති බව දැනුම් දී ඇත. ඒ අනුව නැවත මෙම ඉල්ලීම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලදි.<br>**(ඇමුණුම 6-VIII)** |
| 1.12 | 2019 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2(iv) ඡේදය වේලාව පදනම් කර ගනිමින් අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීමේදී අදාළ කාලය ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින් සනාථ කර ගත යුතු වුවද, ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතයකින් තොරව පැමිණීමේ ලේඛන පමණක් පදනම් කර ගනිමින් 2022 වර්ෂය තුළදී අතිකාල හා නිවාඩු දින වැටුප් ලෙස රු.63,411,490 ක් ගෙවා තිබුණි.<br><br>වර්ෂ ගණනාවක සිට විගණන වාර්තා මඟින් මෙය පෙන්වා දී තිබුණු අතර ඒ අනුව රු.422,500ක් වැයකර ඇඟිලි සලකුණු යන්ත්‍ර 19ක් සවිකර තිබුණු නමුත් ප්‍රධාන කාර්යාලයේ ඇඟිලි සලකුණු යන්ත්‍රය හැර අනිකුත් අංශවල සවිකර තිබුණු ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා නොකරන බව නිරීක්ෂණය විය. | වරින් වර ලිඛිතව හා වාචිකව ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින් පැමිණීම පිටවීම සටහන් කිරීමට කටයුතු කරන ලෙස දැනුම් දී ඇතත් කාර්යය මණ්ඩලය විසින් එම උපදෙස් පිළි නොපදියි. ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ හා දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනයේ සේවයේ නියුතු සියලු වෛද්‍ය නිලධාරීන් හැර සෙසු කාර්යය මණ්ඩලය සඳහා අතිකාල හා නිවාඩු දින වැටුප් සඳහා ගෙවීම් සිදු කරනුයේ ඇඟිලි සලකුණු යන්ත්‍ර දත්ත පදනම් කරගෙන පමණි. කෙසේ වුවද සෙසු ආයතන වල පැමිණීමේ හා පිටවීමේ ලේඛන අනුව පැමිණීම හා පිටවීම තහවුරු කරන බවට සියලු ආයතන ප්‍රධානීන් විසින් පෞද්ගලික අධීක්ෂණය මත ලිඛිත තහවුරුවක් ලබාගෙන දැනට අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවනු ලබයි. **(ඇමුණුම 6-IX)** |
| 1.13 | 2021 වර්ෂය තුළදී මුළු පිරිවැය රු.20,799,715 ක් වූ අයිතම 23 කට අයත් කාර්යාලීය ගෘහ භාණ්ඩ ඒකක 1,239 ක් හා මුළු පිරිවැය රු.6,987,850 ක් වූ රෝහල් ගෘහ භාණ්ඩ ඒකක 312 ක් මාතලේ ප්‍රදේශයේ සැපයුම්කරුවකුගෙන් මිලදීගෙන තිබුණි. වර්ෂය අවසානයේ ප්‍රසම්පාදනය සැලසුම් කර තිබීම, කාර්යාලීය ලී බඩු උපකරණ සම්බන්ධයෙන් පත්කළ තාක්ෂණික ඇගයීම් කමිටුවට විෂයය විශේෂඥයකු පත්කර නොතිබීම, සියලුම උපකරණ පිරිවිතරවලට අනුකූලව ලැබී ඇති බවට විධිමත්ව තහවුරු කර | මෙම ප්‍රසම්පාදනය 2021 වර්ෂයේ පශ්චාත් කොවිඩ් වර්ෂය තුල බොහෝ දුෂ්කරතා මැද සිදුකර ඇත. අදාළ කාලය තුල රටේ සේවා හා සැපයීම් ජාලය දැඩි ලෙස බිඳ වැටුණ කාලයකි.<br>විගණනයෙන් දක්වා ඇති භාණ්ඩ මිලදී ගැනීම විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් සිදුකර ඇත.<br>මෙම කාර්යය සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කර තිබූ අතර, අදාළ කමිටුව මඟින් මිලදී ගැනීමට සැලසුම් කරන ලද භාණ්ඩ සඳහා පිරිවිතර සකස් කර |

| | | |
|---|---|---|
| | ගැනීමකින් තොරව ගෙවීම් කර තිබීම, ඇණවුම්කළ ප්‍රමාණයට වඩා වැඩියෙන් සපයා තිබුණු උපකරණ සඳහා ගෙවීම් කිරීම, ඇණවුම්කළ උපකරණවලට වඩා වෙනස් උපකරණ භාරගැනීම සහ ගෙවීම් කිරීම, ප්‍රමාද ගාස්තු අයකර නොතිබීම සහ ප්‍රතිපාදන සලසා නොගත් වැය විෂයයක් යටතේ රු.11,809,305 ක් ගෙවීම් කිරීම යන අඩුපාඩු මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ පැවැති බව නිරීක්ෂණය විය.<br><br>මෙම ප්‍රසම්පාදනයේ අඩුපාඩු සිදු වීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරින්ට එරෙහිව විනයානුකූලව කටයුතු කිරීම සම්බන්ධයෙන් අවධානය යොමු කර නොතිබුණි. | ඇත.අදාළ තාක්ෂණික ඇගයීම් කමිටුව තුළ දැවමය භාණ්ඩ සඳහා විශේෂ දැනුමක් සහිත ඉංජිනේරුවරයෙක් නියෝජනය කර නොමැත. එයට හේතුව වුයේ එවැනි දැනුමැති ඉංජිනේරුවරයෙකු රජයේ දෙපාර්තමේන්තු කාර්යාලයකින් සපයා ගැනීමට ඇති අපහසුතාවයයි.<br><br>කෙසේ වුවද,පත්කරන ලද තාක්ෂණික ඇගයීම් කමිටුව විධිමත් අධ්‍යනයක් මත අදාළ පිරිවිතර ඉදිරිපත් කර ඇත.<br><br>ඒ අනුව 2021 අගොස්තු මස 11 දින අදාළ ලංසු කැඳවීමේ නිවේදනය ත්‍රෙභාෂා ජාතික පුවත්පත්වල පල කර ඇත.<br>එම ලංසු කැඳවීම අනුව ආයතන 03 කින් ලංසු යෝජනා ඉදිරිපත් කර ඇත.<br>එම ලංසු විවෘත කිරීම නිළධාරීන් දෙදෙනෙකුගෙන් යුතු කමිටුවක් මගින් 2021.09.15 දින සිදුකර ඇත.<br><br>අදාළ තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ මත ප්‍රසම්පාදන කමිටුව 2021.10.12 දින රැස්වී ප්‍රසම්පාදන තීරණ ලබාදී ඇති අතර, 2021.10.12 දින අමාත්‍යාංශ ලේකම් අදාළ ප්‍රසම්පාදන කමිටු තීරණය අනුමත කර ඇත. **(ඇමුණුම 6-X)**<br><br>සියලුම අයිතම තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශයට අනුකූලව විධිමත්ව භාරගෙන විධිමත්ව අදාළ ආයතන වෙත භාරදීමෙන් පසු ගෙවීම් සිදුකර ඇත.<br><br>රට තුල පැවති ව්‍යාකුල තත්වය මත ඉතා අපහසුවෙන් ප්‍රසම්පාදන ඉලක්ක සපුරා ගෙන ඇති අතර, එම ප්‍රමාදයන් විගණන විමසුමට ලක්කර ඇත.<br><br>සියලුම උපකරණ පිරිවිතරවලට අනුකූලව ලැබී ඇති බවට විධිමත්ව තහවුරු කර ගැනීමකින් පසු ගෙවීම් කර ඇත.ඇණවුම් කල භාණ්ඩ සඳහා පමණක් ගෙවීම් කර ඇත. ඇණවුම් කල ප්‍රමාණයට වඩා වැඩියෙන් උපකරණ සපයා නැති අතර, එවැනි ගෙවීමක් සිදුකර නැත. ඇණවුම් කල උපකරණවලට වඩා වෙනස් උපකරණ භාරගැනීමක් සිදුකර නැත. සියළු උපකරණ භාරගැනීම අදාළ නිලධාරී කමිටුවේ නිර්දේශ මත සිදු කර ඇත |
| 3.11 | 2021 වර්ෂයේ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණු සුවධරණී ඖෂධ මංජුසා ලක්ෂ 60 ක් බෙදා දීමේ ව්‍යාපෘතිය යටතේ බස්නාහිර පළාතට ඖෂධ මංජුසා 250,000 ක් සැපයීමට පරිපූරක ප්‍රතිපාදන රු.250,000,000 ක් වෙන්කර ගෙන ඉන් රු.142,562,809 ක් වැය කර තිබුණි. ලංසු ඇගයීමේදී පැවති විවිධ අඩුපාඩු පසුව සම්පූර්ණ කිරීමට යටත්ව | තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ලබා දී ඇති නිර්දේශ මත පදනම්ව එහි සඳහන් කර ඇති අඩුපාඩු සම්පූර්ණ කර ඇත. ශකාත්ත්‍රාත්කරුවන්ට ගෙවීම් කිරීමේ දී ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත පමණක් සිදු කර ඇත.<br><br>එවකට රටතුළ පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හා වරින් වර පැනවූ ගමන් සීමා නිසා ගෙවීම් ගිහි විම, අමු ද්‍රව්‍ය සපයා ගැනීමට අපහසු වීම, ප්‍රවාහන |

| | | |
|---|---|---|
| | සැපයුම්කරුවන් තෝරා ගැනීම, තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ නොසලකා කටයුතු කිරීම, සියලුම ප්‍රසම්පාදනයන් නියමිත දිනට අවසන් නොකිරීම, ප්‍රසම්පාදන මණ්ඩලයේ අනුමැතිය රහිතව කාලය දීර්ඝ කිරීම, ප්‍රමාද ගාස්තු අය නොකිරීම, මිල කමිටුවේ මිල ගණන් ඉක්මවා ගෙවීම් කිරීම යන අඩුපාඩු මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ පැවැති බව නිරීක්ෂණය විය. ඖෂධ මංජුසා සෞඛ්‍ය ආරක්ෂිතව ගබඩා නොකිරීම, අක්‍රමවත් බෙදාහැරීම, ඖෂධ පිරවීමටත් පෙර ඇසුරුම්වල කල් ඉකුත් වීමේ දිනය මුද්‍රණය කර තිබීම හේතුවෙන් ඇතැම් ඖෂධ කල් ඉකුත් වූ සේ සලකා ඉවත් කිරීම, කල් ඉකුත්වීමට පෙර ඖෂධ භාවිතා කිරීමට ප්‍රමාණවත් කාලයක් ප්‍රතිලාභීන්ට ලැබී නොතිබීම, ඉලක්ක ගත ප්‍රතිලාභීන් වෙත ඖෂධ ලැබීම සහ භාවිතය පිළිබඳ අධීක්ෂණය සහ පසුවිපරම් නොකිරීම, 2021 දෙසැම්බර් 31 දිනට දින 122 ක් ගතව තිබුණද ව්‍යාපෘතියෙන් සියයට 05 ක්වත් අවසන්කර නොතිබීම, යනාදී අඩුපාඩු මෙම ප්‍රසම්පාදනය තුළ පැවති බව නිරීක්ෂණය විය.<br><br>මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කර නොමැති අතර සැලකිය යුතු මූල්‍ය අක්‍රමිකතා හා නිලධාරීන්ගේ නොසැලකිල්ල හේතුවෙන් රජයේ මුදල් අපතේ ගොස් ඇති බව නිරීක්ෂණය විය. | පහසුකම් සම්බන්ධව ගැටළු පැවතීම ආදී හේතු නිසා නිෂ්පාදන කටයුතු ප්‍රමාද වී ඇති බැවින් නියමිත දිනට අවසන් කිරීමට නොහැකි වූ අතර රට තුළ පැවති වසංගත තත්ත්වය පොදු කරුණක් බැවින් කොන්ත්‍රාත්කරුවන්ගෙන් ප්‍රමාද ගාස්තු අය කිරීම ප්‍රයෝගික නොවන බැවින් අය කිරීම් සිදු කර නැත. විගණන නිරීක්ෂණ අනුව කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබා ගෙන සිදු කිරීම උචිත බව පිළිගන්නා අතර කොන්ත්‍රාත් පරිපාලනය සම්බන්ධයෙන් ආයතන ප්‍රධානියාට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම දීර්ඝ කිරීම් සිදු කර ඇත.<br><br>සුව ධරණී ප්‍රතිශක්ති වර්ධක පානය හා ගුඩුච්‍යාදි (කෂාය) පාණ්ඩය මිල කමිටුවේ නිර්දේශිත මිල ගණන්වලට යටත්ව ගෙවීම් කර ඇත. ඖෂධීය ප්‍රතිශක්ති වර්ධක කැඳවල නිසි ප්‍රමිතිය පවත්වා ගැනීමට අවශ්‍ය බැවින් තරඟකාරී ලෙස කැඳවන ලද මිල ගණන් සැලකිල්ලට ගනිමින් මිල කමිටුවේ නිර්දේශිත මිලට සපයා ගැනීමට සැපයුම්කරුවන් සමඟ එකඟතාවයකට පැමිණීම සඳහා සාකච්ඡා වාර කිහිපයක් පවත්වා ඇත. එහෙත් මිල කමිටුවේ නිර්දේශිත මිලට සැපයිය නොහැකි බවත් එසේ වුවහොත් ඔවුන් ටෙන්ඩර් කටයුතුවලින් ඉවත් වන බවත් ප්‍රකාශ කර ඇත. සැපයුම්කරුවන් ලංසු මිලෙහි අඩු කිරීමකට කල එකඟතාවය මත එම මිලට ප්‍රසම්පාදනය පිරිනැමීම සිදු කර ඇත. ඉතිරි වී තිබූ සීමිත කාල සීමාව, වෙනත් විකල්පයක් සඳහා ප්‍රමාණවත් නොවූ බැවින් ව්‍යාපෘතියේ කටයුතු අඛණ්ඩව සිදු කර අවසන් කිරීමට කටයුතු කර ඇත. |
| 1.12 | දෙපාර්තමේන්තුව හා පෞද්ගලික ආරක්ෂක සේවා සැපයුම්කරුවන් අතර සේවා ගිවිසුම් කොන්දේසිවලට අනුව ආරක්ෂක නිලධාරියෙකු අඛන්ඩව පැය 12කට වඩා වැඩියෙන් සේවයේ යෙදවිය හොත් ඒ සඳහා කිසිදු ගෙවීමක් නොකළ යුතු වුවද, ඊට පටහැනිව රෝහල් 11 ක හා ඔසු උයන් 6 ක පැය 12 ඉක්මවා යොදවා තිබුණු සේවා මුර 2,619 ක් වෙනුවෙන් රු.2,668,317 ක් ගෙවා තිබුණි. තවද, එක් එක් දිනයේ සේවයේ යෙදවිය යුතු නියමිත නියාමකයින් සංඛ්‍යාව සේවයේ නොයෙදවූ විට ඒ සඳහා එක් පුද්ගලයෙකුගේ දිනක වැටුපක් අඩු කිරීමට හා නොපැමිණි සේවකයින් සඳහා නියමිත වැටුප නොගෙවිය යුතු බව දක්වා තිබුණද, ඊට පටහැනිව නියමිත සේවකයින් දෙනිකව සේවයේ නොයෙදවූ සේවා මුර 562 ක් වෙනුවෙන් රු. 598,473 ක්ද පෞද්ගලික ආරක්ෂක සේවා සැපයුම්කරුවන් 4 දෙනෙකුට ගෙවා තිබුණි.<br><br>ගිවිසුම් වලට එලඹීම, ක්‍රියාත්මක කිරීම හා පසු විපරම් කිරීම සම්බන්ධයෙන් හා විනය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් කළමණාකාරිත්වය ප්‍රමාණවත් සැලකිල්ලක් දක්වා නොතිබුණි. | 2021 වර්ෂයේදී ද කොරෝනා වසංගත තත්වයට මුහුණ දීමට සිදු වූ බැවින් රෝගය පැතිරීම වැළැක්වීම සඳහා එක් එක් ආයතන විවිධ ක්‍රමවේද අනුගමනය කරන ලදී. ඒ අනුව, එම කාලයේදී ප්‍රවාහන අපහසුතා පැවතීම හා පුද්ගල නිරෝධායනය නිසා ආරක්ෂක කටයුතු සඳහා සේවා මුර මාරුවීම් සිදු නොකර පැය 24 ක් කාලයක් එක් ආරක්ෂක නිලධාරියෙක් සේවයේ යොදවා ඇති බව ඒ ඒ ආයතන වලින් යොමුකර ඇති ලිපි මගින් පැහැදිලි වේ.<br>**(ඇමුණුම 6-XI )**<br><br>එසේම 2023 වර්ෂයේදී රට තුළ ඇති වූ ආර්ථික අර්බුදය හේතුවෙන් ඉන්ධන හිඟවීම මත ගමනාගමනය අඩාලවීම නිසා සේවා මුර මාරුවීම් සිදු නොකර පැය 24 ක කාලයක් සේවයේ යොදවා ඇත.<br><br>යම් හෙයකින් පැය 12 ක සේවා මුරයක් සේවයේ යෙදෙන නිලධාරියා සේවා මුරය අවසන් කළද ඊලඟ පැය 12 සේවා මුරය සඳහා ආරක්ෂක නිලධාරියකු වාර්තා නොකලහොත් ඒ ඒ ආයතන වල පවතින රාත්‍රී දේපළවල ආරක්ෂාව සම්බන්ධව ගැටළුකාරී තත්වයක් මතුවේ. ඒ අනුව අදාළ ආයතන ප්‍රධානියා ගෙන ඇති තීරණය අනුව එම කාලසීමාවන් වලදී රෝගී සත්කාරක සේවා අඛණ්ඩව පවත්වාගෙන යාමත් ගුණාත්මක සේවාවක් ලබා දීම සඳහාත් පොදු |

| | | |
|---|---|---|
| | | දේපළවල ආරක්ෂාව සලසා ගත හැකි පරිදි පැය 24 සේවා මුරයේ යොදවා ගැනීමට සිදු වී ඇති බව දන්වා සිටිමි. එහිදී ගිවිසුම්ගත වූ වටිනාකම ඉක්මවා ගෙවීම් කිරීමක් සිදු කර නොමැත. **(ඇමුණුම 6- XII )** |
| 3.13 | 2022 වර්ෂයේ ජුනි සිට දෙසැම්බර් දක්වා ආයුර්වේද දෙපාර්තමේන්තුව හා ඊට අනුබද්ධිත ආයතන 18ක ආරක්ෂක සේවා සැපයීම සඳහා වූ රු. 74,759,059ක කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රයේ 1.2.1 (ඉ), 2.12, 4.2.2, 4.2.3 සහ 4.3 යන මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු කර නොතිබුණි. එමෙන්ම කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව දිනපතා පැය 24 ම ආවරණය වන පරිදි සියළුම සේවා ලක්ෂ්‍යවල නිලධාරීන් යොදවන බව තහවුරු කර ගැනීම පිණිස විධිමත්ව අධීක්ෂණ නිලධාරියකු පත්කර නොතිබුණි.<br><br>ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුකූලව කටයුතු කිරීම සේවා සැපයුම්කරුවන් සමඟ ගිවිසුම්වලට එලඹීම එම ගිවිසුම් ක්‍රියාත්මක කිරීම හා පසු විපරම් කිරීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් සැලකිල්ලක් දක්වා නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 (ඉ), 2.12, 4.2.2, 4.2.3 සහ 4.3 යන මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු කිරීමට ගත හැකි සෑම පියවරක්ම ගෙන තිබුණි.<br><br>එසේම සියලුම ආයතන වල ආරක්ෂක නිලධාරීන් සේවා ලක්ෂ්‍ය වල යොදවනු ලබන බව තහවුරු කිරීම ඇතුළු සියලු අධීක්ෂණ කටයුතු සඳහා ඒ ඒ රෝහල්/ ආයතන වලින් නිලධාරීන් පත් කිරීම සිදු කර ඇති බවද දන්වා සිටිමි. |
| 3.14 | 2022 වර්ෂයේ ජුලි සිට දෙසැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුවට අයත් පරිශ්‍රයන්හි පිරිසිදු කිරීමේ සේවාව සැපයීම සඳහා වූ රු.1,947,258 ක කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් රජයේ මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.4.3, 2.5.1 (ආ), 2.6.1(අ)(i) සහ 4.2.2, යන මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු කර නොතිබුණි. එමෙන්ම අදාළ කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව කොන්ත්‍රාත්කරු විසින් සේවකයින්ගේ නම අත්සන ලිපිනයන් ඇතුළත් වාර්තාවක්ද, පිරිසිදු කිරීමේ රසායන ද්‍රව්‍යවල සංඝටකයන් හා භාවිතයට සුදුසු බවට විධිමත් තත්ත්ව සහතිකයක්ද, හැඳුනුම්පත් සැපයීමටද කටයුතු කර නොතිබුණි. තවද සේවකයින්ගේ පැමිණීම හා පිටවීම සේවකයින්ට ගෙවන ලද මාසික වැටුප, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තියන්ගේ භාර අරමුදලට කරන ලද ප්‍රේෂණ, යනාදී තොරතුරුද කාලීනව සැපයීමට කටයුතු කර නොතිබුණි.<br><br>ප්‍රසම්පාදන කටයුතු හා ගිවිසුම්ගත සේවා පවත්වා ගෙන යාමේදී දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලන කටයුතු ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය වේ. | රජයේ මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.4.3 අනුව ප්‍රසම්පාදන කටයුතු සඳහා ප්‍රමුඛත්වය ලබාදීම සම්බන්ධයෙන් තාක්ෂණික ඇගයීම් කමිටුව දැනුවත් කරමින් ලිපි ඉදිරිපත් කර ඇත. **(ඇමුණුම 6-XIII)**<br><br>පිරිසිදු කිරීමේ සේවා සපයන ආයතන සමඟ එළඹ ඇති ගිවිසුම් ප්‍රකාරව ලංසු පත්‍රිකාවේ ගිවිසුම් කොන්දේසි තහවුරු කර ගැනීම සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුවට අනුබද්ධිත රෝහල් / ආයතන සඳහා පිරිසිදු කිරීමේ සේවාව සපයන වැඩ පරීක්ෂකයන්ට හා කම්කරුවන්ට ගෙවන ලද මාසික වැටුප, සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තියන්ගේ භාර අරමුදල් මණ්ඩලයට කරන ලද ප්‍රේෂණ වාර්තා පිළිබඳ විස්තර මාස 03 කට වරක් දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලෙස දන්වමින් ලිපි ඉදිරිපත් කර ඇත. **(ඇමුණුම 6-XIV)**<br><br>සේවා යෝජකයා විසින් සේවක අර්ථසාධක අරමුදල් සහ සේවා නියුක්තික භාර අරමුදල් සඳහා ගෙවීම් සිදු කර ඇති බව තහවුරු කරමින් ලේඛන ඉදිරිපත් කර ඇත.<br>**(ඇමුණුම 6-XV )**<br><br>තවද, ඉදිරියේදීද සේවකයින්ගේ සේවක අර්ථසාධක අරමුදල් සහ සේවා නියුක්තික භාර අරමුදල් ගෙවීම |

| | | |
|---|---|---|
| | | සම්බන්ධ කම්කරු දෙපාර්තමේන්තුවෙන් තහවුරුවක් ලබා ගැනීමට සටහන් කර ගනිමි. |
| 1.15 | ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන 2001 වර්ෂයේ සිට නියමු ව්‍යාපෘතියක් ලෙස අනුරාධපුර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කර 2005 වර්ෂයේ සිට අනෙකුත් දිස්ත්‍රික්කවලට ව්‍යාප්ත කළ යුතු වුවද, 2024 වර්ෂය දක්වාම එය අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පමණක් ක්‍රියාත්මක කර තිබුණු අතර ව්‍යාපෘතිය සඳහා 2005 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා රු.මිලියන 877.2 ක් වැය කර තිබුණි. 2022 වර්ෂයේ සිට ව්‍යාපෘතිය සඳහා වෙනම ප්‍රතිපාදන සලසා නොතිබුණු අතර සංවර්ධන වැඩසටහනේ රෝගී ප්‍රතිකාර සේවා ව්‍යාපෘතිය යටතේ පුනරාවර්තන වියදම් සඳහා පමණක් ප්‍රතිපාදන සලසා ගෙන නිලධාරීන් 218 දෙනෙකුට වැටුප් හා දීමනා වශයෙන් රු. මිලියන 287.4 ක්ද අනෙකුත් වියදම් සඳහා රු.මිලියන 5.5 ක්ද වශයෙන් මුළු එකතුව රු.මිලියන 292.9 ක් වැයකර තිබුණි. කෙසේ වුවද අනෙකුත් දිස්ත්‍රික්කවලට ව්‍යාප්ත කිරීමට තරම් සාර්ථකව ක්‍රියාත්මක නොවූ මෙම ව්‍යාපෘතියට අදාළ පරිපාලන වියදම් දෙපාර්තමේන්තුවේ රෝගී ප්‍රතිකාර සේවා වැය විෂයයන් මගින් ආවරණය කරමින් තව දුරටත් පවත්වාගෙන යාමට කටයුතු කර තිබුණි.<br><br>මෙම ව්‍යාපෘතියෙන් ඉටු කරන කාර්යයන් වෙනත් දිස්ත්‍රික්ක වල ඉටු කිරීම සඳහා පළාත් ආයුර්වේද කොමසාරිස්වරුන් යටතේ පාලනය වන ආයුර්වේද ප්‍රජා වෛද්‍ය නිලධාරීන් බඳවා ගෙන තිබුණි. ඒ අනුව අනුරාධපුර දිස්ත්‍රික්කයේද ආයුර්වේද ප්‍රජා වෛද්‍ය සේවාව පවත්වාගෙන යාම වෙනුවට මෙම ව්‍යාපෘතිය තවදුරටත් පවත්වා ගෙන යන බව නිරීක්ෂණය විය. | මෙම ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සේවය සඳහා ප්‍රජා සෞඛ්‍ය සංවර්ධන නිලධාරීන් හා අනෙකුත් කාර්යමණ්ඩලය මධ්‍යම රජය යටතේ බඳවාගෙන තිබීමත් එවකට දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ ස්ථිර කාර්යාල ඉදිකර වඩා විධිමත් වූ සේවාවක් වශයෙන් මෙම ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සේවය පවත්වාගෙන යාම හේතුවෙන් මෙලෙස මධ්‍යම රජයේ ආයතනයක් ලෙසටම පවත්වාගෙන ගොස් ඇත.<br>ප්‍රාථමික සෞඛ්‍ය සංරක්ෂණය සඳහා ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේ යොදාගැනීම් අත්හදා බැලීම් ආදී සියලු පර්යේෂණ කටයුතු සිදුකරන මධ්‍යම රජයේ ආයතනයක් ලෙස අනුරාධපුර ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සේවාව භාවිතා කරනු ලබයි.<br>තවද විදෙස් බටහිර වෛද්‍ය සිසුන් හා වෛද්‍යවීය සිසුන් ඒකාබද්ධ සෞඛ්‍ය සේවා සැපයුම් වෙනුවෙන් වූ අධ්‍යන සඳහා අනුරාධපුර ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සේවාවේ සහාය ලබාගනී.<br><br>2008 වර්ෂයේ සිට දිවයිනේ සියලුම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස ආවරණය වන ලෙස ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් 817 දෙනෙකු සහ වකුගඩු රෝග සහ බෝ නොවන රෝග පාලනය සඳහා තවත් ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් 308 දෙනෙකු ලෙස වෛද්‍ය නිලධාරීන් 1,125 ක් පත්කර වඩා විධිමත් ලෙස අදාළ ප්‍රාථමික සෞඛ්‍ය<br>සේවා කටයුතු මේ වන විට ක්‍රියාත්මක කර ඇත. මෙම ව්‍යාපෘතියේ ප්‍රගතිය **(ඇමුණුම 6-XVI )** පෙන්වා ඇත.<br><br>අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව මෙම ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන නියමු ව්‍යාපෘතියක් ලෙස අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කිරීම සාර්ථක වී ඇත. මෙම නියමු ව්‍යාපෘතිය සාර්ථකව වසර 02ක් ක්‍රියාත්මක කර ප්‍රගතිය මැන බැලීමට 2003 වර්ෂයේදී ඇන්ඩaa සිල්වා මහතාගේ සභාපතිත්වයෙන් යුත් කමිටුවක් පත් කර ඇත. එම කමිටුව මගින් ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ වාර්තාව අනුව අඩු පහසුකම් සහිත ප්‍රදේශයන්හි තවදුරටත් කරගෙන යායුතු බව තීරණය කර ඇත.<br>එම වාර්තාවේ නිර්දේශ මත 2005 වර්ෂයේ සිට මෙම ව්‍යාපෘතිය කැබිනට් අනුමැතිය සහිතව **(ඇමුණුම 6-XVI-I) කැබිනට් පත්‍රිකාව)** ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සේවය ලෙස පවත්වාගෙන ගොස් ඇත.<br><br>එහෙත් මෙම ව්‍යාපෘතිය අනෙක් දිස්ත්‍රික්කවලට ව්‍යාප්ත කිරීමට අමාත්‍යාංශයෙන් ප්‍රතිපත්ති තීරණයක් ගතයුතු වේ. ප්‍රජා සෞඛ්‍ය සේවය ක්‍රියාත්මක කිරීම පිළිබඳව නිර්දේශ ලබා ගැනීමට කමිටුවක් පත් කරන ලෙස අමාත්‍යතුමා විසින් උපදෙස් ලබාදෙන ලදි. |

**වර්තමාන කාර්ය සාධනය පිළිබඳ සාකච්ඡා කළ යුතු කරුණු**

| | | |
|---|---|---|
| 1.1 | ඇඳන් 288කින් යුක්ත සාමාන්‍ය වාට්ටු 08කින්, ඇඳන් 75කින් යුක්ත ගෙවන වාට්ටු කාමර | මෙම ගොඩනැගිල්ලේ ගෙවන ඇඳන් 87කින් යුක්ත කාමර 67කින් සමන්විත ආකාරයට සකස් කර ඇත. |

| | | |
|---|---|---|
| | 50කින් සහ ගෙවන ගෘහ ඒකක 12කින් යුක්තව බොරැල්ල ආයුර්වේද රෝහලේ ඉදිකළ නව අටමහල් ගොඩනැගිල්ල 2022 මාර්තු 24 දින විවෘත කර තිබුණු නමුත් එම ගොඩනැගිල්ල සැලසුම් කිරීමේදී ජල ටැංකියක් පල්දෝරු පද්ධතියක් හා ප්‍රධාන විදුලි සම්බන්ධතාවයක් නිසි පරිදි ඇතුලත් නොකිරීම නිසා සම්පූර්ණ ධාරිතාවයෙන් උපයෝජනය කර ගැනීමට නොහැකිව තිබුණි. ඒ අනුව ගොඩනැගිල්ල විවෘත කළ දින සිට 2024 ජුලි 23 දක්වාම ඇඳන් 87ක ධාරිතාවයක් සහිත ගෙවන වාට්ටු ක්‍රියාත්මක නොකිරීම නිසා රු.මිලියන 378.25කට අධික අපේක්ෂිත ආදායමක් රජයට අහිමි වී තිබෙන බවත්, 2018 වර්ෂයේදී රු.මිලියන 264.61කට ඇස්තමේන්තු කර තිබුණු ඉතිරි ඉදිකිරීම් කටයුතු ඉටු කිරීම ප්‍රමාද වීම හේතුවෙන්, අදාළ ඇස්තමේන්තු පිරිවැය 2024 වර්ෂය වන විට රු.මිලියන 715.27ක් දක්වා ඉහල යාමෙන් රු.මිලියන 450.67ක අතිරේක පිරිවැයක් දැරීමට රජයට සිදුවන බවත් නිරීක්ෂණය විය. තවද, ගොඩනැගිල්ල විවෘත කර වසර 02කට අධික කාලයක් ගතවී තිබුණද එය කාර්යක්ෂමව උපයෝජනය කරමින් අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය භෞතික හා මානව සම්පත් සැලසුම් කර ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. | ඊට අමතරව නොගෙවන ඇඳන් 217කින් යුත් එක් එක් තට්ටුවල වාට්ටු සංකීර්ණ ස්ථාපිත කර ඇත. ඒ අනුව සමස්ථ ඇඳන් සංඛ්‍යාව 304කින් යුක්ත වේ. මෙම ව්‍යාපෘතිය ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත පවරා තිබුණු අතර නියමිත කාලය තුළ එය අවසන් කර ගැනීමට නොහැකි විය. මෙම වසරේ ප්‍රතිපාදන ලබා දී ඉතිරි වැඩ අවසන් කිරීමට කටයුතු කර ඇත. **(ඇමුණුම 6-XVII)**<br><br>ඒ අනුව මේ වනවිට විදුලි සැපයුම සඳහා අවශ්‍ය ජෙනරේටරය සවිකර ඇති අතර ට්‍රන්ස්ෆෝමර් සපයා ගැනීමට මුදල් ගෙවීම් කර ඇත. ජල නළ පද්ධතිය සම්පූර්ණයෙන්ම නිමකර ඇති අතර ගිනි ආරක්ෂණ පද්ධතිය සකස් කිරීමේ කටයුතු ආරම්භ කර ඇත.<br><br>මලාපවාහන පද්ධතිය ස්ථාපිත කිරීම සෞඛ්‍ය අමාත්‍යාංශය හරහා කොළඹ මහ නගර සභාව වෙත අවශ්‍ය මුදල් ද යවා ඇති අතර එම වැඩකටයුතු නිම කිරීමට මහ නගර සභාව වෙත පවරා ඇත.<br>එසේම භෞතික පහසුකම් සපයා ගැනීම සඳහා රෝහල් උපකරණ සහ අනෙකුත් ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර මිළ ගනන් කැඳවා ඇත.අතිරේක කාර්යය මණ්ඩලය අනුමත කරගැනීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.<br>කෙසේ වෙතත් නොගෙවන ඇඳන් 217 න් 159 ක ප්‍රමාණයක් වත්මන් මානව හා භෞතික සම්පත් උපයෝගී කරගනිමින් ජනතාව වෙත උපරිම සේවයක් ලබා දීමට කටයුතු කර ඇත. |
| 4.2 | දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යවරයාගේ සංකල්පයක් අනුව AyurEx Colombo 2023 නමින් දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයක් හා අධ්‍යාපන වෙළඳ ප්‍රදර්ශනයක් 2023 සැප්තැම්බර් 08, 09 සහ 10 යන දිනවල බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේ පවත්වා තිබුණි. අදාළ වැඩසටහන සඳහා විධිමත්ව ප්‍රතිපාදන සලසා ගැනීමට කටයුතු නොකර ආයුර්වේද ඖෂධ සංස්ථාවෙන් රු. 5,000,000 ක්ද, පෞද්ගලික අංශයේ ආයතනවලින් රු. 23,469,950 ක්ද, එකතු කරගෙන තිබුණු අතර එම මුදල් දෙපාර්තමේන්තු සුභසාධක සංගමයේ ගිණුමකට බැර කර ගෙන වියදම් දරා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ. | |
| (අ) | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149(1) ව්‍යවස්ථාව අනුව රජයට ලැබෙන සියලුම ආදායම් හා ලැබීම් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු අතර මුදල් රෙගුලාසි 170(2) ප්‍රකාරව මුදලින් ලැබෙන තෑගි පිළිගනු ලැබුවහොත් ඒ මුදල්ද රාජ්‍ය ආදායමට බැර කර විධිමත් පරිදි ප්‍රතිපාදන සලසාගෙන අදාළ තෑගි මුදල් ලැබීමට හේතු වූ නිශ්චිත කාර්යය ක්‍රියාත්මක කළ හැකිය. එසේ වුවද මෙම විධිමත් ක්‍රියාමාර්ග අනුගමනය නොකර ආයුර්වේද කොමසාරිස්වරයාගේ නිලනාමය භාවිතා කරමින් බාහිර පාර්ශව වෙතින් පරිත්‍යාග ලබා ගැනීමට ලිපි යවමින් සුභ සාධක සංගමයේ බැංකු ගිණුමට මුදල් බැර කිරීමට උපදෙස් දී තිබුණි. | මෙම ව්‍යාපෘතිය සිදු කිරීමේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149 ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක් කිසිසේත් සිදුකර නොමැති අතර ව්‍යාපෘතිය සඳහාම යකඩක්කර ඇති ලිපි ශීර්ෂයන් මඟින් අදාළ ආරාධනා සිදු කර ඇති බව දන්වමි. |

| | | |
|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව මිල ගණන් කැඳවීමකින් තොරව සුභසාධක සංගමය විසින් ආයුර්වේද කොමසාරිස්වරයාගේ යෝජනාවක් අනුව රු.28,945,285 ක වියදමින් මෙම ප්‍රදර්ශනය කළමනාකරණය කිරීම සඳහා මහනුවර පිළිමතලාව ප්‍රදේශයේ සිලෝන් එක්සිබිෂන්ස් ඇන්ඩ් කෝපරේට් සර්විසස් පුද්ගලික සමාගම නම් ඉසව් කළමනාකරණ ආයතනය තෝරා ගෙන තිබුණි. | මෙම ව්‍යාපෘතිය සඳහා සියළු ආදායම් රැස්කිරීම, වියදම් කිරීම සිද්ධි කළමනාකරුවන් තෝරා ගැනීම, ඔවුන් සමඟ ගිවිසුම් ගතවීමේ ක්‍රියාවලිය, අදාළ සුභසාධක සංගමය විසින් සිදු කර ඇති අතර ඒ සඳහා දෙපාර්තමේන්තුවේ මහ පෙන්වීමද සිදුකර ඇත. |
| (ඈ) | ඉසව් කළමනාකරණ ආයතනයට චෙක්පත් වලින් සෘජුවම මුදල් ගෙවීමට හැකියාව තිබියදී සුභ සාධක සංගමයේ නිලධාරීන් විසින් අවස්ථා 03කදී රු.10,881,642 ක් බැංකුවෙන් මුදල් ලබාගෙන අදාළ ආයතනයේ ගිණුමට තැන්පත් කර තිබුණු අතර එයට හේතුව විමසීමේදී ආයුර්වේද කොමසාරිස් ජනරාල්වරයා වාචිකව හා ලිඛිතව ඒ සඳහා උපදෙස් දී ඇතිබව සුභසාධක සංගමයේ නිලධාරීන්ගේ ප්‍රකාශයන් අනුව නිරීක්ෂණය විය. | දේශීය වෛද්‍ය ව්‍යවසායකත්වය නගා සිටුවීම සඳහා බහු පාර්ශවීය ප්‍රවේශයක් වශයෙන් ආයුර්වේද දෙපාර්තමේන්තුව හා එක්ව ආයුර්වේද දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලීය සුභ සාධක සංගමය විසින් සංවිධානය කරන ලද Ayur EX Colombo 2023 වැඩ සටහනේ ඉසව් කළමනාකරණ ආයතනය වන Ceylon Exhibitions & Corporate Services (Pvt) Ltd ආයතනය විසින් සිදු කරන ලද වාචික ඉල්ලීම මත මෙම ගෙවීම සුභසාධක සංගමය විසින් සිදු කර ඇත.<br><br>2023.09.22 චෙක්පත් අංක 541155 මඟින් රු. 3,014,692 ක්ද 2023.09.27 චෙක්පත් අංක 541157 මඟින් රු. 4,366,950/- ක්ද, 2023.10.17 දින චෙක්පත් අංක 541159 මඟින් රු. 3,500,000/- ක් ද වශයෙන් Ceylon Exhibitions & Corporate Services (Pvt) Ltd ආයතනයේ ගිණුම වෙත තැන්පත් කර ඇත. (අදාළ බැංකු තැන්පතු කුවිතාන්සි අමුණා ඇත) එම ගෙවීම එම ආයතනයට ගෙවිය යුතු මුදලක් වන අතර ඔවුන්හට චෙක්පත ලබා ගැනීමට පැමිණීමට තිබූ අපහසුතාවය හා Ayur EX Colombo 2023 වැඩ සටහන සාර්ථක කර ගැනීමට බාහිර ආයතන වෙත ගෙවිය යුතු මුදල් කඩිනමින් ගෙවීමට අවශ්‍ය වීම හේතුවෙන් මෙම චෙක්පත් මුදල් කර අදාළ ආයතනයේ ගිණුමට තැන්පත් කර ඇත.<br><br>මෙම Ayur EX Colombo 2023 වැඩ සටහනට අදාළ සියළු ගෙවීම් හා ලැබීම් පිළබඳ වාර්ෂික ගිණුම් ප්‍රකාශ වාර්තා මඟින් සාමාජිකයින් දැනුවත් කිරීමට මෙන්ම අනුමත කිරීමද සිදු කර ඇත. **(ඇමුණුම 6-XVIII)** |
| (ඉ) | ආයුර්වේද කොමසාරිස් ජනරාල්වරයා ඇතුලු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් කිහිප දෙනෙකුගේ සෘජු මැදිහත්වීම මත විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවලින් ලැබුණු මුදල් සුභසාධක සංගමයේ බැංකු ගිණුමට බැර කිරීමෙන් පසු රු.28,326,935ක් කොමසාරිස් ජනරාල්වරයාගේ උපදෙස් හා සුභ සාධක සංගමයේ අභිමතය පරිදි වැය කර තිබුණු අතර මින් රු.1,820,430ක වියදම සනාථ කිරීම සඳහා ඉදිරිපත් කිසිවක් සංගමය සතුව නොතිබුණි. | භාණ්ඩාගාර ලේකම්ගේ 2022.04.26 දිනැති අංක 3/2022 දරන රාජ්‍ය වියදම් පාලනයට අදාළ අයවැය චක්‍රලේඛය හා 2023.01.27 දිනැති 01/2023 අයවැය චක්‍රලේඛ අනුව ඒකාබද්ධ අරමුදලට වැය බරක් නොවන ලෙස රජයට අයත් කිසිදු මුදලක් මෙම Ayur EX Colombo 2023 වැඩ සටහන සඳහා භාවිතා කර නොමැත.<br><br>ආයුර්වේද දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලය සුභසාධක සංගමයට අරමුදල් රැස්කර ගැනීමේ අරමුණින් හා දේශීය වෛද්‍ය ව්‍යවසායකත්වය නගා සිටුවීම අරමුණින් සංවිධානය සිදු කරන ලද මෙම වැඩ |

| | | |
|---|---|---|
| | 2023 දෙසැම්බර් 31 දිනට එම ගිණුමේ රු.143,015ක් පමණක් ඉතිරිව තිබුණි. | සටහන සඳහා සිදු කරන ලද සියලු ගෙවීම් සංගමය මඟින් සෘජුවම සිදු කර ඇත. එසේම මෙම අවසාන ගිණුම් වාර්තාව සංගමයේ ගිණුම් පරීක්ෂක විසින් පරීක්ෂා කර මහා සභාවට යොමු කර අනුමත කර ඇත. 2023 වර්ෂයේ මුදල් පොතේ පිටපතක් මේ සමඟ අමුණා ඇති අතර ඒ අනුව AyurEX Colombo 2023 වැඩ සටහන අවසන්වීමෙන් පසුව සංගමය විසින් සිදු කරන ලද සංගමයේ වියදම් හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට එම ගිණුමේ රු. 143,015 ක් ඉතිරිව ඇති බව සඳහන් කරමි. |
| (ඉ) | වැඩිදුර පරීක්ෂාවේදී 2024 අප්‍රේල් 01 දින රු.422,000ක්, 2024 අප්‍රේල් 30 දින රු.474,000ක්, 2024 මැයි 05 දින රු.11,000ක් වශයෙන් එකතුව රු.907,000ක මුදලක් බාහිර පාර්ශවයන් විසින් සුභසාධක සංගමයේ ජංගම ගිණුමට බැර කර තිබුණු බව සංගමයේ මුදල් පොත අනුව අනාවරණය විය. ඊට අදාළ තොරතුරු සුභසාධක සංගමය සතු නොවූ අතර ආයුර්වේද කොමසාරිස්වරයාගේ වාචික උපදෙස් මත 2024 අප්‍රේල් 24 දින, අංක 541187 හා 2024 මැයි 02 දින, අංක 5411092 දරන මුදල් චෙක්පත් පී.ඒ.පරණගම නමැති අයෙකුට රු.896,000ක් ල්බා දී තිබුණු අතර එම ගෙවීමට අදාළ තොරතුරු සුභසාධක සංගමය සතු නොවීය. මේ අනුව කොමසාරිස් ජනරාල්වරයා විසින් සුභසාධක සංගමයට අයත් නොවූ කාර්යයන් වෙනුවෙන් අවිධිමත් ආකාරයෙන් මුදල් රැස්කිරීමට හා වියදම් කිරීම සඳහා මෙම සුභසාධක සංගම් ගිණුම භාවිතා කර ඇති බව නිරීක්ෂණය විය. | මෙම වැඩ සටහනට අදාළ ලැබීම් ගෙවීම් වාර්තාවක් මේ සමඟ ඉදිරිපත් කර ඇත. තවද මෙය International Symposium එකක් සඳහා පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කර ලියාපදිංචි වන අයගේ ප්‍රවේශපත්‍ර ගාස්තු මෙලෙස සංගමයේ ගිණුමට බැර කර ඇත.<br><br>කැලණිය විශ්ව විද්‍යාලයේ Department of Chemistry මඟින් සිදු කළ එම වැඩ සටහන සඳහා මහාචාර්ය පී.ඒ. පරණගම මහත්මිය විසින් ඉදිරිපත් කර ඇති මුදල් ඇස්තමේන්තුගත වියදම් වෙනුවෙන් අදාළ ගෙවීම 2024.04.24 දින අංක 541187 හා 2024.05.02 දින අංක 541192 දරන චෙක්පත් මඟින් සිදු කර ඇත. අදාළ කාලසීමාවේ විශ්ව විද්‍යාල තුල පැවති වෘත්තිය සමිති ක්‍රියාමාර්ග හේතුවෙන් මෙලෙස මෙම සම්මන්ත්‍රණයේ සභාපති ලෙස කටයුතු කරන ලද මහාචාර්ය පී.ඒ. පරණගම මහත්මිය වෙත ගෙවීම සිදු කර ඇත. |
| 4.3 | දෙපාර්තමේන්තුවට නිතර ඖෂධ සපයන සැපයුම්කරුවකුට 2021 ඔක්තෝබර් 14 දින සුවධරණී ප්‍රතිශක්තිජනක පානය නිෂ්පාදනය සඳහා අවශ්‍ය කොත්තමල්ලි කිලෝග්‍රෑම් 1,845ක් හා හීං අරත්ත කිලෝග්‍රෑම් 450ක් සැපයීමේ කොන්ත්‍රාත්තුවක් ලබාදී තිබුණු අතර සැපයුම්කරු හීං අරත්ත පසුව සපයන බව සඳහන් කරමින් කොත්තමල්ලි තොගය පමණක් සපයා තිබුණි. 2021 දෙසැම්බර් 08වන දින වන විටද හීං අරත්ත සපයා නොතිබුණද සැපයූ කොත්තමල්ලි තොගය සඳහා සම්පූර්ණ මුදල වශයෙන් රු. 791,550ක් සැපයුම්කරුට ගෙවා තිබුණු අතර 2022 මැයි 04 දින සිට ආයුර්වේද කොමසාරිස්වරයා විසින් සුවධරණී ප්‍රතිශක්තිජනක පානය නිෂ්පාදනය අත්හිටුවා තිබුණි. ඒ අනුව රෝහලේ වෙනත් නිෂ්පාදන කටයුත්තක් සඳහාද යොදා නොගෙන අක්‍රමවත්ව ගබඩා කර තිබුණු අදාළ කොත්තමල්ලි තොගය 2022 ඔක්තෝබර් 01 දින මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු විසින් | බොරැල්ල ආයුර්වේද ජාතික රෝහලේ අක්‍රමවත්ව ගබඩා කර තිබූ කොත්තමල්ලි තොගය 2022 ඔක්තොබර් 01 දින මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු විසින් භාවිතයට නුසුදුසු බවට සීල් තබා තිබුණි. මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා වාර්තාවක් ලබාදීම සඳහා පරීක්ෂණ කමිටුවක් පත් කර ඇත. එම කමිටුව විසින් 2023.05.06 දින ලබා දී තිබූ වාර්තාව අසම්පූර්ණ බව නිරීක්ෂණය වී ඇති බැවින්, කොත්තමල්ලි තොගය පිළිබඳව ඉදිරි කටයුතු කිරීම සිදු වී නොමැත. එබැවින්,නැවත වරක් 2024.01.21 එම කමිටුව වෙතින් වාර්තාවක් ඉල්ලුම් කර ඇති අතර, මෙම පරීක්ෂණ කටයුතු කරගෙන යාමට රෝහලෙන් ලැබෙන සහයෝගය අවම බව සඳහන් කරමින් මෙම පරීක්ෂණය සෞඛ්‍ය අමාත්‍යාංශය වෙතින් සිදු කිරීමට නිර්දේශ කර ඇත. ඒ අනුව 2025.12.31 දින සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත එම නිර්දේශ ඉදිරිපත් කර ඇත. **(ඇමුණුම 6-XIX)** |

| | | |
|---|---|---|
| | භාවිතයට නුසුදුසු බවට සීල් තබා තිබුණි. කෙසේ වුවද, මේ සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරින් හඳුනාගෙන අදාළ අලාභ අයකර ගැනීමට කිසිදු පියවරක් දෙපාර්තමේන්තුව විසින් ගෙන නොතිබුණි. | |
| 1.4 | 2017 ජුනි 02 දිනැති විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉල්ලීමක් අනුව දේශීය වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනය ස්ථාපිත කිරීමට බොරැල්ල ආයුර්වේද රෝහලේ ප්‍රධාන ගොඩනැගිල්ලේ 05වන මහල භාරදී තිබුණු අතර විධිමත් ගිවිසුමකට එළඹී නොතිබුණි. රෝගීන් සඳහා භාවිතා කිරීමට තිබුණු වැසිකිලි පද්ධතියක්ද රෝහලේ ජල හා විදුලි සම්බන්ධතාවයක්ද අදාළ ආයතනයට ලබාදී තිබුණු නමුත් යම් කුලියක් හෝ 2023 දෙසැම්බර් 31 දින දක්වා වූ රු.මිලියන 08කට අධික හිඟ විදුලි පරිභෝජන ගාස්තුව හෝ දෙපාර්තමේන්තුව අය කර ගෙන නොතිබුණි. තවද, කිසිදු කුලියක් නොගෙවා බොරැල්ල ආයුර්වේද රෝහල තුළ අලෙවිසැල් පවත්වාගෙන යමින් සැලකිය යුතු පිරිවැටුපක් ලබන ආයුර්වේද ඖෂධ සංස්ථාවෙන් සහ ජාතික පශු සම්පත් මණ්ඩලයෙන් අදාළ අලෙවිසැල් වෙනුවෙන් කුලියක් අයකර ගැනීමට හැකිවන කොන්දේසි ඇතුළත් ගිවිසුම් වලට එළඹීමට කටයුතු කර නොතිබුණි. | බොරැල්ල ආයුර්වේද ජාතික රෝහලේ පස්වන මහලේ ඇති දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂ වෙත 2018 වර්ෂයේ සිට 2023 දක්වා නාමික වශයෙන් හිඟ විදුලි පරිභෝජන ගාස්තු ගෙවන ලෙස වරින් වර දැනුම් දී ඇත.<br>ඒ අනුව 2023.09.22 දින සිට 2019 වසරේ සිට 2022 දක්වා ජල ගාස්තු සඳහා රු.58391.30 ක මුදලක් ගෙවා ඇති අතර 2026 පෙබරවාරි මස දක්වා ජල ගාස්තු සඳහා මසකට රු.1850/= බැගින් ගෙවීම් සිදු කර ඇත .<br><br>එමෙන්ම 2025 ජනවාරි මස සිට විදුලිය සඳහා රු.91,184.42 ක මුදලක් මාසිකව ගෙවීම් කරනු ලැබේ..<br><br>තවද, එම අයවීමට ඇති ඉතිරි මුදල ගෙවීම් සඳහා ප්‍රමාණවත් මූල්‍ය පහසුකම් නොමැති බැවින් එම හිඟ විදුලි බිල් ගෙවීම් කපා හැරීමට ඉල්ලුම් කර ඇත. එසේ මුදල් කපාහැරීම සඳහා ප්‍රතිපාදන නොමැති බව දන්වමින් නැවත එම හිඟ විදුලි ගාස්තු ගෙවන ලෙස අංක Ayu/Acc/04/02-(i) හා 2026.03.23 දිනැති ලිපිය මඟින් දන්වන ලදී. **(ඇමුණුම 6-XX)**<br><br>තවද මෙම ආයතනයට ගොඩනැඟිල්ල භාරදෙන ලෙස දැනුම් දී ඇත. ඒ හේතුවෙන් ගිවිසුම් ගතවීම ප්‍රමාදවී ඇතත්,මේ වන විට ගිවිසුම් ගතවීමට කටයුතු කරමින් පවතී. |
| 1.5 | දෙපාර්තමේන්තුව සතුව බස් රථ 02 ක්, ලොරි රථ 02 ක්, කැබ් රථ 07 ක්, වෑන් රථ 06 ක්, මෝටර් කාර් 07 ක්, ජීප්රථ 01 ක්, ගිලන්රථ 09 ක්, ත්‍රීවිලර් 05 ක් ට්‍රැක්ටර් 11 ක් , බවුසර් 02 ක් හා යතුරුපැදි 05 ක් ඇතුළු වාහන 57 ක් පැවැති අතර කාලීනව ඉන්ධන පරීක්ෂාවන් සිදුකර නොතිබීම, ඇතැම් නිලධාරීන් නිසි අනුමැතියකින් තොරව වාහන භාවිතා කර තිබීම, වාහන අවභාවිතා කල නිලධාරීන් හා රියදුරන් සම්බන්ධයෙන් විනය පියවර නොගැනීම, වාහන සඳහා ඉන්ධන පිරවීමේදී එම කටයුතු මාණ්ඩලික නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ සිදුකර නොතිබීම, වාහන ධාවන අවසර පත්‍ර පරීක්ෂාවන් නිසි පරිදි සිදු නොවීම සහ රියදුරන්ගේ අක්‍රමිකතාවයන් වළක්වා ගැනීම සඳහා ප්‍රමාණවත් පාලන ක්‍රම අනුගමනය නොකිරීම යනාදී කරුණු | ආයුර්වේද දෙපාර්තමේන්තුව සතු වාහන සඳහා ඉන්ධන පරීක්ෂාවන් සිදු කිරීම ආරම්භ කර ඇති අතර 2025 වාහන 15ක ඉන්ධන පරීක්ෂාවන් සිදුකර අවසන් කර ඇත. 2026 වර්ෂයට අදාළව ඉන්ධන දහන පරීක්ෂාව නව චක්‍රලේඛය අනුව ඉදිරියේදී සිදු කිරීමට කටයුතු කරනු ඇත. **(ඇමුණුම 6-XXI)**<br>වාහන අවභාවිතා කර ඇති නිලධාරීන් හා රියදුරන් සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් පැවැත්වීමට අදාළව ලිපියක් අංක AYU/ADM/T/විගණන හා 2024.07.26 දිනැතිව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කර ඇත.<br>ඒ අනුව නිසි අවසරයකින් තොරව දෙපාර්තමේන්තුව සතු වාහන භාවිතා කිරීමට අදාළ මූලික විමර්ෂණ කටයුතු සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් සිදු කරනු ලබන අතර, වෛද්‍ය තරංග මහතාට අදාළ මූලික විමර්ෂණ කටයුතු මේ වන විට අවසන් වී ඇත. |

| | | |
|---|---|---|
| | හේතුවෙන් දෙපාර්තමේන්තුවේ වාහන පරිපාලනය හා වාහනවල ආරක්ෂාව සම්බන්ධයෙන් සතුටුදායක තත්ත්වයක් නොපැවැති බව නිරීක්ෂණය විය. | මේ වන විට ආයුර්වේද දෙපාර්තමේන්තුවෙන් වාහන පිටවීමේදී වාහන ධාවන අවසර පත්‍රය පරීක්ෂා කිරීම අනිවාර්ය කර ඇති අතර ඒ බව දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරීන් හා ආරක්ෂක අංශ වෙත ලිඛිතව දැනුම් දෙන ලදි.<br>වාහන සඳහා ඉන්ධන පිරවීමේදී එය කාර්මික නිලධාරී හෝ ප්‍රවාහන නිලධාරී අධීක්ෂණය යටතේ සිදුකිරීම ආරම්භ කර ඇත. **(ඇමුණුම 6-XXI -1)**<br>ධාවන අවසර පත්‍ර අනුමත කිරීමකින් තොරව රාජකාරී කටයුතු සඳහා දෙපාර්තමේන්තුව සතු වාහන ආයතන පරිශ්‍රයෙන් පිටතට රැගෙන නොයන ලෙස රියදුරු මහතුන් දැනුවත් කිරීමටත් කටයුතු කර ඇත. |
| 4.6 | වර්ෂ කිහිපයක අනුමත නිවාඩු ප්‍රමාණය ඉක්මවා නිවාඩු ලබා ගෙන තිබුණු බොරැල්ල ජාතික ආයුර්වේද රෝහලේ ආයුර්වේද සේවා සහයකයින් 08 දෙනෙකුගේ උසස්වීම් අයදුම්පත් නිර්දේශ කර දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීමේදී ඔවුන්ගේ වැටුප් රහිත නිවාඩු පිළිබඳ විස්තර දක්වා නොතිබුණු බැවින් ඒ පිළිබඳව අවධානය යොමු නොකර 2023 මාර්තු මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි එම නිලධාරීන්ට උසස්වීම් ලබා දී තිබුණු බවත්, බොරැල්ල ජාතික ආයුර්වේද රෝහලේ සේවය කරන නිලධාරීන් 44 දෙනෙකු විසින් නිසි අනුමැතියකින් තොරව ලබාගෙන තිබුණු නිවාඩු සහ අනුමත සීමාව ඉක්මවා ලබාගෙන තිබුණු නිවාඩු දිනයන් වැටුප් රහිත නිවාඩු ලෙස සලකා කටයුතු නොකිරීම හේතුවෙන් රු.453,475 ක වැටුප් වැඩියෙන් ගෙවා තිබුණු බවත් 2023 ඔක්තෝබර් මස 31 දින සිදු කල නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | ආයුර්වේද සේවා සහයකයින් 08 දෙනෙකුගේ උසස්වීම් අයදුම්පත් නිර්දේශ කිරීමේදී වැටුප් රහිත නිවාඩු ලබා තිබුණද ඉන් නිලධාරීන් 05ක් ආසන්න වසර 05ක වැටුප් වර්ධක උපයාගෙන ඇති බැවින් උසස් වීම් ලබා දී ඇත. තවද ඉතිරි නිලධාරීන් තිදෙනා නියමිත වැටුප් වර්ධක උපයාගෙන නොමැති බැවින් පෙර සිටි තනතුර වෙත මුදා හැර ඇත.<br><br>වැටුප් රහිත නිවාඩු ලබා ගත් කාර්ය මණ්ඩලය වෙතින් අදාළ වැඩිපුර ගෙවූ වැටුප් ආපසු අයකර ගැනීමට කටයුතු කර ඇත. |

**Annexure 06**

| Serial No. | Audit observations mentioned in discussion note | Clarifications and Current Progress of the Enumeration Officer |
|---|---|---|
| Current status as per the order of the Committee on Pre-Public Accounts dated August 09, 2017 | | |
| 2.6 | The Department of Ayurveda has 07 herbal gardens with an area of over 272 acres, but there is no formal program to use the produce from those gardens for the production of medicines in Ayurvedic hospitals, so they had to purchase large quantities of raw materials from external suppliers. It was observed that in 2023 only 629.17 kg of 35 types of medicinal ingredients were procured from 05 herbal gardens and in 2022 only 531 kg of 06 types of drugs were obtained from 03 herbal gardens and 09 types of drugs were supplied to Borella and Navinna hospitals from herbal gardens with external purchases. It was observed that 3,602 kg of the drug 09 was purchased at a cost of Rs.2,566,799 and only 84 kg was procured from herbal gardens. | The main purpose of the herbal gardens owned by the Department of Ayurveda is to conduct research on medicines and to distribute medicines. For this reason, no serious attention has been paid to the production of medicines from herbal gardens before. Accordingly, the provision of medicines required for the production of medicines to hospitals has been at a minimum level.<br>Paying attention to this, the necessary steps have been taken to direct the medicinal harvest of the herbal gardens to the production of medicines and to cultivate medicines for the production of medicines. In the year 2026, the Department of Ayurveda has paid attention to the medicinal requirement and is taking necessary steps to calculate the quantities of medicines that can be provided from the herbal gardens and provide them. **(Annexure 6-I)** |
| 2018, 2019, 2020, 2021 and 2022 Important Points to be Discussed in Auditor General's Reports | | |
| 3.1 | By the end of the year 2022, the value of 12 lands that had not been legally transferred to the department was Rs. 2,318,020,000 was shown under non-financial assets in the financial statements and the value of 07 lands that had been legally transferred to the department had not been recognized and accounted for.<br>Ampara Ayurvedic Research Hospital and related land worth Rs. 137.1 million and it has been stated that it will be assessed and accounted for in April 2024 and other lands will be acquired and will be assessed and accounted for after such acquisition. Thus, it was observed that the financial statements do not reflect the true and fair condition of the property owned by the department. | As per the instructions given to assess and account for all lands occupied by state institutions in the years 2018-2019, the value of the lands where hospitals and institutions of the Department of Ayurveda are located has been assessed. The necessary steps are currently being taken to confirm the ownership of those lands and a summary report related to this is being submitted herewith. **(Annexure 6-II)** |
| 3.2 | There were 27 plots of land used for the department's activities, but 19 plots of land where the department's head office premises, Borella Teaching Hospital, Hospital, Herb Garden, Community Health Regional Office and Recreational Bungalows were located had not been handed over to the department by the end of the year under review. | n relation to all the lands that have been enjoyed by state institutions for some time without taking over the land ownership, as per the instructions given to assess and account for those lands in the years 2018-2019, the value of 07 lands where the hospitals and institutions of the Ayurveda Department are located and assessed without taking over the land ownership has been accounted for at a value of Rs. 612,925,000. Similarly, 6 lands whose |

| | | |
|---|---|---|
